# දකුණු පළාත් සභාව

## අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යංශය

## දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

**දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

1. **පත්වීමේ ස්වභාවය -** ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

2. **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

HM 2- 1 - රු.91,645-12X2,700-124,045

3. **සුදුසුකම්**

**3.1 බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යා (සිවිල්) උපාධියක් ලබා තිබීම

සමග

සිවිල් ඉංජිනේරු විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හෝ එක්සත් රාජධානියේ ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ , රාජ්‍ය සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර විස්ස(20)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම හා අවම වශයෙන් මින් වසර පහ(05) ක් වත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පළපුරුද්දක් විය යුතුය.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යා(සිවිල්) උපාධියක් ලබා තිබීම

සමග

සිවිල් ඉංජිනේරු විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව ආචාර්ය උපාධියක් ලබා තිබීම

සහ

ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ , පළාත් රාජ්‍ය සේවයේ , රාජ්‍ය සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ට කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ(05) ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියකු වශයෙන් සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**3.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන (අ) හෝ (ආ) සුදුසුකම් සපුරා තිබීම

හෝ

දකුණු පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මාර්ග හා පාලම්) තනතුරෙහි වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. **වයසඃ-**

බාහිර අයදුම්කරුවන් අවු.35 ට නොඅඩු හා අවු.55ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

5. **වෙනත් සුදුසුකම්ඃ-**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

6. **බඳවාගැනීමේ ක්‍රමය**

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරු තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ නිල වෙබ් අඩවිය වන www.edumin.sp.gov.lk හි පළකර ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කර ගන්නා ලද අයදුම්පත් **"ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යංශය, දක්ෂිණපාය,ලබුදූව, ගාල්ල"** ලිපිනයට 2024.04.20 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස කාරුණිකව දන්වන අතර, ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවර **"සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම"** ලෙසන් සටහන් කිරීම අනිවාර්යය වේ.

**රංජිත් යාපා,**
**ලේකම්,**
**දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යංශය.**